# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
பொலிஸ் ஊடகப் பிரிவு
POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date: 2025.11.28 පැය 0545 | දුරකථන අංකය Tel.NO: 011-2887973 | මගේ අංකය My NO: D/Media/Out/ 2124/2025 | විද්‍යුත් ලිපිනය E-Mails: dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. මනුෂ්‍ය ඝාතනයක් - මහරගම පොලිස් වසම.**

2025.11.27 වන දින අළුයම් කාලයේ මහරගම පොලිස් වසමේ මහරගම නගරයේ ඇති වෙළඳසැලක් අසල මියගිය කාන්තාවකගේ නිරුවත් මළසිරුරක් ඇති බවට මහරගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකාරිය වයස අවුරුදු 64 ක් වූ කුඹුකවත්ත, ගෝනපල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෘත ශරීරය සම්බන්ධව පශ්චාත් මරණ පරීක්ෂණය කළුබෝවිල රෝහලේදී සිදු කර ඇති අතර එහිදී මරණකාරිය ස්ත්‍රී දූෂණයට ලක් කර ඝාතනය කර ඇති බවට අනාවරණය වී ඇත.

මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා මහරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය මන්නාරම උප ඒකකය.**

2025.10.27 වන දින දහවල් කාලයේ පේසාලේ පොලිස් වසමේ මරියකොරට් පාර ප්‍රදේශයේදී පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යංශය මන්නාරම උප ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 760 ක් සන්තකයේ තබාගෙන යතුරුපැදියකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු යතුරුපැදිය සමග අත්අඩංගුවට ගෙන පේසාලේ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**සැකකරු වයස අවුරුදු 29 ක් වන පේසාලේ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

පේසාලේ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - පරසන්ගස්වැව පොලිස් වසම.**

2025.11.27 වන දින උදෑසන කාලයේ පරසන්ගස්වැව පොලිස් වසමේ පරසන්ගස්වැව 04 ඇල මාර්ගයේ 04 ඇල හන්දිය ආසන්නයේදී 04 ඇල හන්දියේ සිට පරසන්ගස්වැව දෙසට ධාවනය කල යතුරුපැදියක් මාර්ගය හරහා වැටී තිබූ ගසක කඳ කොටසේ ගැටී යතුරුපැදිය පෙරලී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරුපැදිකරු අනුරාධපුරය රෝහලට ඇතුලත් කිරීමෙන් පසුව මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 56 ක් වූ පරසන්ගස්වැව ප්‍රදේශයේ පදිංචි උඩමළුව පොලිස් ස්ථානයට අනුයුක්තව රාජකාරි කළ පොලිස් සැරයන්වරයෙකි.**

මෘත ශරීරය අනුරාධපුරය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර පරසන්ගස්වැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**